# සීමාසහිත ගාල්ල දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය

# තනතුරු පුරප්පාඩු

| තනතුර | ප්‍රධාන කළමනාකරු |
|---|---|
| **කේත අංකය** | EL 01 |
| **ශ්‍රේණිය** | III ශ්‍රේණිය |
| **වයස් සීමාව** | අවුරුදු 18 ත් 45 ත් අතර |
| **සුදුසුකම්** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍ය, ව්‍යාපාර කළමනාකරණ, ගණකාධිකරණ යන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද හෝ |
| | උසස් ජාතික තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ගණකාධිකරණ / ව්‍යාපාර මූල්‍ය / ව්‍යාපාර පරිපාලන (HNDBF/HNDA/HNDBA) ඩිප්ලෝමාව (උපාධියට ගැළපෙන SLQF Level 05 හෝ ඊට ඉහළ) සමත්වීම හා අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 5 ක පළපුරුද්ද හෝ |
| | ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙහි ව්‍යාපාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 05 කට නොඅඩු පළපුරුද්ද / පුහුණුව ලබාතිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 5 ක පළපුරුද්ද හෝ |
| | EL 03 මට්ටමේ 1 ශ්‍රේණියේ තනතුරක සේවය කිරීම හෝ EL 03 මට්ටමේ II ශ්‍රේණියේ තනතුරක වසර 04 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |
| **II ශ්‍රේණිය** | III ශ්‍රේණියේ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක / කළමනාකරණ අධ්‍යක්ෂ (ග්‍රාමීය බැංකු) තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය / ජාතික සමුපකාර මණ්ඩලයෙහි ව්‍යාපාර සංවර්ධන / මානව සම්පත් / ගණකාධිකරණ / ක්ෂුද්‍රමූල්‍ය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා සමත්වීම |
| **I ශ්‍රේණිය** | II ශ්‍රේණියේ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක / කළමනාකාර අධ්‍යක්ෂ (ග්‍රාමීය බැංකු) තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| **වැටුප් පරිමාණය** | (EL - 01) - 54,000 - 1,300 X 5 - 1,600 X 5 - 1,900 X 10 - 2,200 X 10 - 2,500 X 12 = 139,500.00 |
| **තනතුර** | **බැංකු සහකාර තනතුර** |
| **කේත අංකය** | SUL |
| **ශ්‍රේණිය** | III ශ්‍රේණිය |
| **වයස් සීමාව** | අවුරුදු 18 ත් 45 ත් අතර |
| **සුදුසුකම්** | අ.පො.ස. උසස් පෙළ විභාගය වාණිජ අංශයෙන් විෂයන්03 කින් සමත් වීම සහ පිළිගත් ආයතනයක ගිණුම්කරණය / බැංකුකරණය පිළිබඳ මාස 09 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම / සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ සමත් වීම / සමුපකාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හෝ |
| | OPL - 1 මට්ටමේ පොත් තබන්නා 1 ශ්‍රේණියේ තනතුරේ වසර 03 ක සේවා පළපුරුද්ද හෝ |
| | OPL - 1 මට්ටමේ ප්‍රධාන මුදල් අයකැමි තනතුරේ සේවය කිරීම සහ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ / සමුපකාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම හෝ |
| | OPL - 2 මට්ටමේ මුදල් අයකැමි 1 ශ්‍රේණියේ තනතුරේ වසර 03 ක සේවා පළපුරුද්ද සහ අ.පො.ස. උ/පෙළ විභාගය වාණිජ අංශයෙන් විෂයන් 03 කින් සමත්වීම / සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ / සමුපකාර කළමනාකරණ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම. |
| **II ශ්‍රේණිය** | III ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරී / සහකාර බැංකු සේවා කළමනාකරු / බැංකු සහකාර (සංගම්) තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ / සමුපකාර කළමනාකරණ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම. |
| **I ශ්‍රේණිය** | II ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරී / සහකාර බැංකු සේවා කළමනාකරු බැංකු සහකාර (සංගම්) තනතුරේ වසර05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීම. |
| **වැටුප් පරිමාණය** | (SUL-III) - 43,000 - 750X5-900X5-1,050X10-1,200X10-1,350X12 = 89,950.00 |

සමුපකාර සමිතිවල දැනට සේවයේ නියුතු අය සඳහා වයස් සීමාවක් බල නොපාන අතර, තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත යොමුකළ යුතුය.

තමන් විසින් පිළියෙල කරන ලද අයදුම් පත්‍රයක් අදාළ සුදුසුකම් සනාථ කිරීමේ සහතික පිටපත් සමඟ 2026.07.01 දිනට හෝ එදිනට ප්‍රථම "ගරු සභාපති, සීමාසහිත ගාල්ල දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය, 201, බණ්ඩාරනායක පෙදෙස, ගාල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

අයදුම්පත්‍ර යොමු කරන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ තනතුර සඳහන් කර එවිය යුතුය. සමුපකාර ක්ෂේත්‍රයේ නියුතු අය තම අයදුම් පත්‍රය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

තනතුරුවල තීරණය ගැනීමේ බලය සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

- තනතුරට අදාළව සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවන බවද දන්වා සිටිමි.
- ඉහත තනතුරු සඳහා දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව මගින් අනුමත කරන ලද වැටුප් හා දීමනා ගෙවීම් කරනු ලබන අතර, එයට අමතරව සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්ත අරමුදල හා සමුපකාර සේවක විශ්‍රාම වැටුප් දයකත්වයද හිමි වේ.

**ගරු සභාපති,**
**සීමාසහිත ගාල්ල දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය,**
**201, බණ්ඩාරනායක පෙදෙස, ගාල්ල.**
**2026.06.15**